# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019-09-16 |
|---|---|---|

පැමිණිලිකාරිය : තිලංගනී කණ්ඩම්බි මහත්මිය
259/1 ඒ, සෙත්සිරි මාවත,
කොස්වත්ත, තලංගම.

වගඋත්තරකරු : 01. සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව,
82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02. කේ. සිරිතිවංශ මහතා,
සාමාන්‍යාධිකාරි (වැඩබලන),
රාජ්‍ය දැව සංස්ථාව,
82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03. ආනන්ද තිලකසිරි මහතා
රාජ්‍ය දැව සංස්ථාව
.82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04. එච්. ප්‍රියාණි පෙරේරා මහත්මිය
රාජ්‍ය දැව සංස්ථාව,
82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/2513/16**</u>

උක්ත පැමිණිලිකාරිය විසින් 2016.06.09 වන දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ඉහත සඳහන් 01 වන වගඋත්තරකරු විසින් ඇයගේ සුදුසුකම් මත ලැබිය යුතු නියෝජ්‍ය කළමණාකාරු (මානව සම්පත්) තනතුර ලබා නොදී ඇයට




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் : sechrc@gmail.com

වඩා පළපුරුද්දෙන් අඩු කණිෂ්ඨ අය වන ඉහත නම් සඳහන් 03 වන හා 04 වන වගඋත්තරකරුවන්ට එම තනතුර ප්‍රදානය කර ඇති බවට සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම =:**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති විසින් 2016.08.08 වන දින ඔහුගේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති අතර, එය මානව හිමිකම් සභාවේ සැලකිල්ලට භාජනය කර ඇත. ඔහුගේ ස්ථාවරය වන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ඉහත සඳහන් 03 හා 04 වන වගඋත්තරකරුවන් පැමිණිලිකාරියට වඩා වැඩි ලකුණු ලබා ඇති බවත් ඒ හේතුවෙන් වැඩි ලකුණු ලබාගත් 03 වන හා 04 වන වගඋත්තරකරුවන්ට එම උසස්වීම් ලබාදී ඇති බවත්ය.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලිකාරිය සහ වගඋත්තරකරුවන් ගෙන්වා තොරතුරු ලබා ගෙන ඇති බව ලිපි ගොනුවෙන් හෙළිදරව් වේ. 2017.04.20 වන දිනැති පරීක්ෂණය සඳහා පැමිණිලිකාරිය සිටි අතර වගඋත්තර පාර්ශවය වන ශ්‍රී ලංකා රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන්ව නියෝජ්‍ය කළමණාකරු (නීති) කේ.අයි.ඩී.ඩී. කාරියවසම් මහත්මිය සහ කළමණාකරන සහකාර ජේ.පී.ඒ.සාගරිකා මහත්මිය සහභාගවී ඇත. ඉන් අනතුරුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වූ 2018.05.15 දිනැති පරීක්ෂණයට පැමිණිලිකාරිය පෙනී සිට ඇති අතර, වගඋත්තර පාර්ශවය වෙනුවෙන් නියෝජ්‍ය කළමණාකරු (නීති) කේ.අයි.ඩී.ඩී. කාරියවසම් මහත්මිය කළමණාකාර සහකාර ජේ.පී.එල් සාගරිකා මහත්මිය පෙනී සිට ඇත.

රාජ්‍ය දැව සංස්ථාව විසින් පැමිණිලිකාරිය 1983.12.15 වන දින ලිපිකරු (iv) තනතුරට බඳවා ගෙන ඇති අතර ඇය 1993.04.02 වන දින දක්වා එකි ආයතනයේ මානව සම්පත් කොට්ඨාශයේ සේවය කර ඇත. ඉන් අනතුරුව 1993.04.03 වන දින සම්මුඛ පරීක්ෂණයකින් උසස්වීම් ලබා ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් ඒකකයේ ලිපිකරු (iii) ශ්‍රේණියේ 1998.01.14 දින දක්වා සේවය කර ඇත. ඉන් අනතුරුව පැමිණිලිකාරිය ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයේ 1999.09.07 දින තෙක් සේවය කර ඇත. ඉන් පසුව පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයකින් උසස්වීම් ලබා 2003.08.07 වන දින මුදල් අයකැමි (ii) තනතුරට පත් කර ඇති අතර, 2009.05.04 වන දින සම්මුඛ පරීක්ෂණයකින් උසස් වීම් ලබා ලිපිකරු අධිශ්‍රේණියට පත් කර ඇත. ඉන් පසු සම්මුඛ පරීක්ෂණවලින් උසස්වීම් ලබා 2010.11.19 වන දින ප්‍රධාන කළමණාකාර සහකාර ලෙසත් 2011.03.03 වන දින පෞද්ගලික නිලධාරි ලෙසත්, 2012.05.02 වන දින පරිපාලන නිලධාරි (ii) ශ්‍රේණියටත් 2015.04.01 දින පරිපාලන නිලධාරි (i) ශ්‍රේණියටත් 2016.04.06 වන දින සහකාර කළමණාකාර පරිපාලන (i) ශ්‍රේණියටත් පත්වී ඇත. මෙකී ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ පැමිණිලිකාරිය වසර 35ක කාලයක් සතුටුදායකව එම ආයතනයේ කටයුතු කර ඇති බවය.

කරුණු එසේ තිබියදී නියෝජ්‍ය කළමණාකරු (මානව සම්පත්) තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට පැමිණිලිකාරිය සහ ඉහත නම් සඳහන් 03 වන හා 04 වන වගඋත්තරකරු අතර තවත් අයද ඉදිරිපත්වී ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අය අතුරින් ඉහත නම් සඳහන් 03 වන හා 04 වන වගඋත්තරකරුවන්ට එම තනතුර ලබාදී ඇති අතර. මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් විසින් ඔහුගේ නිගමනය සාධාරණය කිරීම සඳහා යොදාගත් ඉහත නම් සඳහන් 03 හා 04 වන වගඋත්තරකරුවන් සහ පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයේදී ලබා දෙන ලකුණු කොමිෂන් සභාවේ පරිශීලනයට ලක් කොට ඇත.

ඒ අනුව ලකුණු ප්‍රදානය කිරීමේදී ආනන්ද තිලකසිරි යන අයට පළපුරුද්ද සම්බන්ධයෙන් ද අ.පො.ස. උ.පෙළ විභාගය සඳහා උපරිම ලකුණු ද සේවා ඇගයීම් වාර්තාව අනුව මුළු ලකුණු ප්‍රමාණයෙන් අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ද ක්ෂේත්‍රයට අදාල පාඨමාලාව සම්බන්ධයෙන් කිසිම ලකුණක් නොලබා සමස්ථ ලකුණු ලෙස ලකුණු 85ක් ලබාගෙන ඇති බව පෙනී යයි.

04 වන වගඋත්තරකරු උපයාගෙන ඇති ලකුණු සම්බන්ධයෙන් පරිශීලනය කිරීමේදී ඇයට පළපුරුද්ද සඳහා උපරිම ලකුණු ප්‍රමාණයක් ද අ.පො.ස. (සා.පොළ) විභාගය සඳහා උපරිම ලකුණු ප්‍රමාණයක්ද ක්ෂේත්‍රයේ පාඨමාලා සම්බන්ධයෙන් උපරිම ලකුණු ප්‍රමාණයක් ද ඇගයීම් වාර්තාවේ උපරිම ලකුණු වලට වඩා අඩු ලකුණු ද සම්මුඛ පරීක්ෂණයේදී දක්වන පෞරුෂවර්ධනය සඳහා ලකුණු 20 ක් ලබා ගෙන මුළු ලකුණු 84ක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියට ක්ෂේත්‍ර පළපුරුද්ද සඳහා උපරිම ලකුණු 30 ක්ද. අ.පො.ස (උ.පෙළ) සඳහා උපරිම ලකුණු 20 ක්ද. ක්ෂේත්‍රයේ අදාල පාඨමාලා සඳහා උපරිම ලකුණු 5 ක්ද. සේවා ඇගයීම් වාර්තාව ලැබිය යුතු උපරිම ලකුණු 15 ක්ද. වශයෙන් ලකුණු ලබාදී ඇත. නමුත් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද පෞරුෂය සඳහා ලකුණු 10ක් ලබාදී ඇත්තේ කුමන පදනමක් මතද යන්න සැකයක් මතුවේ. මෙම පැමිණිලිකාරියගේ සම්පූර්ණ සේවා කාලය තුළ උසස්වීම් ලබාගෙන ක්‍රමයෙන් එකී ආයතනයේ ඉහළට ගොස් ඇති බව සැකයක් නැත. පරීක්ෂණ අවස්ථාවේදී ඇයගේ පුද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර ඇති අතර. සේවා ඇගයීම් වාර්තාවට උපරිම ලකුණු 15ක් ලබා ගෙන ඇත්නම් ඇය එකී ආයතනයේ සතුටුදායක අයුරින් සේවය කර ඇති බව සාධාරණ නිගමනයක් වේ.

දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරී (වැඩබලන) ආචාර්ය නිමල් රුවන්පතිරණ මහතා විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 2018.05.17 දින දරණ ලිපියේ අවසන් ඡේදයේ සඳහන් කර ඇත්තේ පැමිණිලිකාරියගේ යම් ක්‍රියාවක් හේතුවෙන් ඇයගේ දිනක වැටුපක් කපාහැර

ඇති බවත්ය. එය විෂමාචාර ක්‍රියාවක් බවට එකී ලිපියේ කර්තෘ හෙළිදරව් කිරිමට තැත් කිරීමක් බව පෙනී යයි. එය එසේ නම් ඇයට සේවා ඇගයීම් වාර්තාවට සම්පූර්ණ ලකුණු ලබාදීම කෙසේ ද යන්න ප්‍රශ්නයකි.

**නිගමනය =:**

මෙම කරුණු සමස්ථයක් ලෙස ගත් කල්හි පෙනී යන්නේ සුදුසුකම් ඇති මෙම පැමිණිලිකාරියට පෞරුෂත්වය සඳහා දෙන ලකුණු භාවිතා කරමින් චේතනාත්මකව සම්මුඛ පරීක්ෂණයෙන් ඇයට හිමි තනතුර ලබා නොදීම සම්බන්ධයෙන් එකී පෞරුෂය සඳහා අඩු ලකුණු ලබාදී ඇති බවයි. ඒ අනුව, 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ සුරක්ෂිත කර ඇති නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වයට ඇති අයිතිය පැමිණිලිකාරියට එරෙහිව උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය –**

එබැවින් පැමිණිලිකාරියට ලැබිය යුතු උසස්වීම ලබා දෙන ලෙසට මෙයින් නිර්දේශ කරමු.

2019. 10 . 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තියත ප්‍රකාරව 01 වන වගඋත්තරු වෙත දන්වමි.

එසේම එකී නිර්දේශය කික්‍රයාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු අතර එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
uman Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.